- ඉතින් guys ඔන්න අපි පටන් ගන්නව ICT සහ SMC ඉගෙනගන්න. මෙතනදි මුලින්ම සහ විශේශයෙන්ම කියන්න දෙයක් තියෙනවා. ඒ තමයි මම course කරල නෙවෙයි මේ pdf එක ලියන්නෙ සහ video series එක කරන්නෙ. මම තනියම ගොඩක් sources භාවිතා කරල ඉගෙන ගෙන තමයි මේ වැඩේ කරන්නෙ. සමහරවිට course කරපු අයත් මේක බලනව ඇති. එයාල ඉගෙනගෙන තියෙන්නෙ කොහොමද කියල දන්නෙ නෑ මන්.සමහරවිට සමහර තැන් ගැලපෙන්නෙ නැති වෙන්න පුළුවන්.මම මේක ලියන්නෙ සහ video ටික කරන්නෙ හැමෝටම තේරෙන විදියට සහ analys එකේ accuracy එක උපරිම තියෙන විදියට. එහෙනම් guys අපි පටන් ගමු වැඩ ටික.

# Market Structure

- Forex,crypto,stock හෝ ඕනම market එකක market එක run වෙන ක්‍රම තුනයි තියෙන්නෙ.ඒ තමයි

1. Buy Trend (Up Trend)
2. Sell Trend (Down Trend)
3. Consolidation (Sideways)

- දැන් අපි මේ එකින් එක බලමු විස්තරාත්මකව.

## 1. Buy Trend(Up Trend)

- Market එකක් යට ඉඳන් උඩට,එහෙම නැත්තන් පහල ඉඳන් ඉහලට,එහෙමත් නැත්තන් down side එකේ ඉඳන් up side එකට යනවට තමයි අපි කියන්නෙ market එක buy side තියෙනව කියල.

- මෙතනදි market එක run වෙලා හැදෙන උඩම තැනට අපි කියනවා High එක කියල.එතකොට ඒ හදපු High එකත් කඩාගෙන(Break කරගෙන) උඩට market එක buy උනොත් අපි ඒකට කියනව Higher High කියල.


- Market එක තනි ඉරක් විදියට buy වෙන්නෙ නෑ. Waves විදියට තමයි run වෙන්නෙ.

- එතකොට High එකක් break කරගෙන උඩට market එක buy වෙනකොට අර මන් කලින් කිව්ව වගේ wave එකක් විදියට run වෙන නිසා යට point එකට අපි කියනවා Higher Low කියලා.

- මතක තියාගන්න මේ දේ.Up Trend එකකදි අපි මුලින්ම සඳහන් කරන්නේ(mark කරන්නේ) Higher High

point එක.ඊට පස්සෙ තමයි Higher low එක mark කරන්නේ.

දැන් බලමු උදාහරණත් එක්කම කොහොමද Higher High සහ Higher Low mark කරන්නේ කියලා.




HH=Higher High
HL=Higher low
L=Low

## 2.Sell Trend(Down Trend)

- Market එකක් උඩ ඉඳන් යටට,එහෙම නැත්තන් ඉහල ඉඳන් පහලට,එහෙමත් නැත්තන් up side එකේ ඉඳන් down side එකට යනවට තමයි අපි කියන්නෙ market එක sell side තියෙනව කියල.
- මෙතනදි market එක run වෙලා හැදෙන යටම තැනට අපි කියනවා Low එක කියල.එතකොට ඒ හදපු Low එකත් කඩාගෙන(Break කරගෙන) යටට market එක sell උනොත් අපි ඒකට කියනව Lower Low කියල.


- Market එක තනි ඉරක් විදියට sell වෙන්නෙ නෑ. Waves විදියට තමයි run වෙන්නෙ.

- එතකොට Low එකක් break කරගෙන යටට market එක sell වෙනකොට අර

මන් කලින් කිව්ව වගේ wave එකක් විදියට run වෙන නිසා උඩ point එකට අපි කියනවා Lower High කියලා.

- මතක තියාගන්න මේ දේ.Down Trend එකකදි අපි මුලින්ම සඳහන් කරන්නේ(mark කරන්නේ) Lower Low point එක.ඊට පස්සෙ තමයි Lower High එක mark කරන්නේ.


දැන් බලමු උදාහරණත් එක්කම කොහොමද Lower Low සහ Lower High mark කරන්නේ කියලා.



LL=Lower Low
LH=Lower High
H=High


## 3.Consolidation(Sideways)

- මෙතනදි වෙන්නෙ market එක යම්කිසි price range එකක් ඇතුලෙ run වෙන එක.සරලවම කිව්වොත් market එක නයෙක් ගැරඬියෙක් යනව වගේ run වෙන එක.පහලින් දාන image එකෙන් ඔයාලට ඒක තේරුම් ගන්න පුලුවන් වෙයි.



• ඉතින් ඔන්න අපි ඉගෙනගත්ත market එකේ structures තුන සහ ඒවට උදාහරණත් එක්කම. ඒත් මම කියල තියෙනවනෙ අපි use කරන්නෙ candle stick chart කියල.එතකොට මම එහෙම කියල තියෙනකොටත් මම ම line chart වල උදාහරණ දෙනකොට ඒක ගැලපෙන්නෙ නෑනෙ.ඒක නිසා දැන් බලමු අපි candle stick chart වල කොහොමද මේක වෙන්නෙ කියල.

## 1. Up trend(Buy Trend)




• ඉතින් ඔන්න ඔහොමයි candle sticks වල HH සහ HL ටික mark වෙන්නෙ.

• මතක තියාගන්න මේ කියන දේ හොඳට.candle එකක wick එකකින් HH එක හරි HL එක හරි break කරාට ඒක valid වෙන්නෙ නෑ. හරියටම break කරා කියල කියන්න පුලුවන් වෙන්නෙ,එහෙම නැත්තන් හරිම breakout එකක් වෙන්නෙ candle එකේ body එකෙන් පරණ HH එක හරි HL එක හරි break කරොත් විතරයි. කිව්ව දේ තේරුනේ නෑ වගේනම් පහලින් මම දාල තියෙන image එක බලන්න.




• උඩ දාල තියෙන image එක හොඳට බලන්න. කලින් HH එක break කරල තියෙන්නෙ candle එකේ body එකෙන් නෙවෙයි.Wick එකකින්.ඒක එතකොට valid වෙන්නෙ නෑ.දැන් මන් පහලින් දාන image එක බලන්න.



• මෙතනදි HH එක break වෙලා තියෙන්නෙ candle එකේ body එකෙන්මයි. එතකොට මේ breakout එක හරි.මේක තමයි valid වෙන breakout එක.

## 2.Down Trend(Sell Trend)





• ඉතින් ඔන්න ඔහොමයි candle sticks වල LL සහ LH ටික mark වෙන්නෙ.

• මතක තියාගන්න මේ කියන දේ හොඳට.candle එකක wick එකකින් LL එක හරි LH එක හරි break කරාට ඒක valid වෙන්නෙ නෑ. හරියටම break කරා කියල කියන්න පුලුවන් වෙන්නෙ,එහෙම නැත්තන් හරිම breakout එකක් වෙන්නෙ candle එකේ body එකෙන් පරණ LL එක හරි LH එක හරි break කරොත් විතරයි.

කිව්ව දේ තේරුනේ නෑ වගේනම් පහලින් මම දාල තියෙන image එක බලන්න.



• උඩ දාල තියෙන image එක හොඳට බලන්න. කලින් LL එක break කරල තියෙන්නෙ candle එකේ body එකෙන් නෙවෙයි.Wick එකකින්.ඒක එතකොට valid වෙන්නෙ නෑ.දැන් මන් පහලින් දාන image එක බලන්න.



• මෙතනදි LL එක break වෙලා තියෙන්නෙ candle එකේ body එකෙන්මයි. එතකොට මේ breakout එක හරි.මේක තමයි valid වෙන breakout එක.

All rights Reserved©
ORGA AUKLAND (PVT) LIMITED